


● සංස්කරණය - ප්‍රභාත් විතාන

# සෙලාන් බැංකුව 2021 මූල්‍ය වර්ෂයේ දී රු. බි. 4.6 ක බදු පසු ලාභයක් වාර්තා කරයි

සමාලෝචනයට ලක්වන කාලසීමාව සඳහා බැංකුවේ සමස්ත පොලී ආදායම 2021 වසරේ දී රුපියල් බිලියන 4.3 කින් අඩු වී රුපියල් බිලියන 46.8 ක් දක්වා පහළ බැස ඇත. (2020 වසරේ දී පොලී ආදායම රුපියල් බිලියන 51.1 කි.) 2020 වසරේ දී වාර්තා වූ පොලී වියදම රුපියල් බිලියන 31.6 ට සාපේක්ෂව 2021 මූල්‍ය වර්ෂය තුල රුපියල් බිලියන 23.2 දක්වා 26.66% කින් පහත වැටිණ.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, ශුද්ධ පොලී ආදායම් (NII) වර්ධනය 2020 වසරේ වාර්තා වූ 4.64% ට සාපේක්ෂව සමාලෝචිත කාල සීමාව තුළ 20.98% ක ආකර්ෂණීය වර්ධනයක් වාර්තා කළේය. 2020 වසරේ දී වාර්තා වූ ශුද්ධ පොලී ආන්තිකය (NIM) වූ 3.63% ට සාපේක්ෂව 2021 දී 4.05% ක් වාර්තා වූ අතර වත්කම් සහ බැරකම් කාලෝචිත ප්‍රතිමිලකරණය සහ බැංකුවේ ජංගම සහ ඉතුරුම් ගිණුම් (CASA) පදනම අඛණ්ඩව ශක්තිමත් කිරීම එයට හේතු විය. ජංගම සහ ඉතුරුම් ගිණුම් පදනම 2021 වසරේ දී වසරින් වසරට 19.00% වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 27.6 කින් ඉහළ ගියේය.

බැංකුවේ ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම පෙර මූල්‍ය වර්ෂයේ දී වාර්තා වූ රුපියල් බිලියන 3.7 ට සාපේක්ෂව රුපියල් බිලියන 4.6 දක්වා 24.44% ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. (2020 වසරේ දී 11.89% ක පසුබෑමක් පැවතින.) ගාස්තු සහ කොමිස් ආදායමේ වර්ධනයට ප්‍රධාන වශයෙන් ඇපකර නිකුත් කිරීමේ ගාස්තු, වෙළඳාම ආශ්‍රිත ගාස්තු මෙන්ම ණය සහ කාඩ්පත්වල ගාස්තු ආදායම හේතු විය. බැංකුව 2021 වසරේ දී රුපියල් බිලියන 31.4 ක් ලෙසින් සමස්ත මෙහෙයුම් ආදායම 23.71% ක වර්ධනයක් වාර්තා කළේ පෙර මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රුපියල් බිලියන 25.4 ට සාපේක්ෂව ය.

බැංකුවේ මූල්‍ය උපකරණ වෙළඳාමෙන් ලැබූ ශුද්ධ ලාභය 163.02% කින් අඩු වූ අතර, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සහ රාජ්‍ය සුරැකුම්පත් මත වෙළඳපල අලාභය එය කෙරෙහි බලපෑවේය. සමාලෝචිත වසරේ මූල්‍ය වත්කම් හඳුනා නොගැනීමෙන් ලැබූ ශුද්ධ ලාභය පෙර වසරට සාපේක්ෂ ව 29.28%ක සෘණ වර්ධනයක් වාර්තා කළේය. බැංකුවේ ශුද්ධ අනෙකුත් මෙහෙයුම් ආදායම 2021 වසර සඳහා රුපියල් මිලියන 2,877.6 ක් වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 172.04% ක වර්ධනයකි.



සෙලාන් බැංකුවේ සභාපති රවී ඩයස් මහතා



සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී කපිල ආරියරත්න මහතා.

බැංකුවේ සමස්ත මෙහෙයුම් වියදම් 2020 වසරේ රුපියල් බිලියන 12.8 සිට රුපියල් බිලියන 13.1 දක්වා සමාලෝචිත කාල සීමාව තුළ 2.15% කින් වැඩි විය. බැංකුවේ කාර්ය මණ්ඩල වියදම් පෙර වසරේ රුපියල් බිලියන 7.2 ට සාපේක්ෂව 2021 දී රුපියල් බිලියන 7.3 දක්වා 0.15% කින් සුළු වශයෙන් වැඩි විය. කාර්ය මණ්ඩල වියදම් සඳහා නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම් මත අතීත සේවා පිරිවැය රුපියල් මිලියන 437 ක ආපසු හැරවීමක් ඇතුළත් වන අතර එය බැහැර කළේ නම්, පෙර වසරට වඩා 6.19% කින් පුද්ගල පිරිවැය ඉහළ යනු ඇත. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සාමූහික ගිවිසුම්වලට අනුව වාර්ෂික වැටුප් වැඩි වීම සහ සේවක උසස්වීම් හේතුවෙන් වැටුප් පරිමාණයන් ඉහළ යාමයි.

# මාගම්පුර ලංවා කර්මාන්ත පුරවරයේ නව වානේ සහ සෙවිලි තහඩු කර්මාන්ත ශාලා දෙකකට මුල්ගල් තබයි

ප්‍රභාත් විතාන



සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් මාගම්පුර කර්මාන්තශාලාවට මුල්ගල තැබීම
ඡායාරූපය නිශාන් එස්. ප්‍රියන්ත

යපස් භාවිතයෙන් Steel Billet, Re Bar සහ Wire Rod නිපදවන දිවයිනේ ප්‍රථම සහ විශාලතම කර්මාන්තශාලාවට මුල්ගල තැබීම ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ සහ අනෙකුත් ආරාධිත අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සුබ මොහොතින් මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ ලංවා කර්මාන්තපුරයට අයත් පරිශ්‍රයේදී සිදු විය.

මෙම ව්‍යාපෘතිය ඉතා උසස් තත්ත්වයේ වානේ නිෂ්පාදන සඳහා දීර්ඝකාලීනව නිකැළැල් නාමයක් දරා සිටින 'ලංවා' සන්නාමය හිමිකරු සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් විසින් ලාංකේය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ප්‍රගමනය වෙනුවෙන් සිදුකරන තවත් නව ආයෝජනයකි.

මෙතෙක් කලක් ආනයනික Steel Billet මත රැඳී තිබුණු වානේ Re Bar සහ Wire Rod නිපදවීමේ කර්මාන්තය නව මගකට යොමු කරමින් යපස් භාවිතයෙන් සෘජුවම අවසන් නිෂ්පාදනය ලෙස Steel Billet, Re Bar සහ Wire Rod බවට පත්කිරීම මෙම කර්මාන්තශාලව තුළදී සිදු වෙයි.

"මෙය යුරෝපීය අති නවීන තාක්ෂණය යොදාගෙන ක්‍රියාත්මක කරන කර්මාන්තශාලාවක් වන අතර ඉදිකිරීම් අදියරේ දී මෙන්ම නිෂ්පාදන අදියරේ දීද පරිසර හිතකාමී ක්‍රමවේදයන් අනුගමනය කිරීමට අප ආයතනය බලාපොරොත්තු වෙනවා. එමෙන්ම, සියලු නිෂ්පාදන අදියරවලදී බලශක්තිය උපරිම ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කරන අතර පාරිසරික ආරක්ෂණ මිනුම් දඬුවලට අනුගතව අපේ නිෂ්පාදන ක්‍රියාවලිය සිදු වනු ඇතැයි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් සභාපති නන්දන ලොකුවිතාන මහතා සඳහන් කළෙ ප්‍රකාශ කර සිටියි.

යෝජිත නව කර්මාන්ත ශාලාවේ වාර්ෂික නිෂ්පාදන ධාරිතාව මෙට්‍රික් ටොන් ලක්ෂ හයක් වන අතර Steel Billet, Re Bar සහ Wire Rod යන ප්‍රධාන නිෂ්පාදන වර්ග වලින් එය සමන්විත වේ. මූලිකවම දේශීය වෙළඳපොළ අරමුණු කරගෙන නිෂ්පාදනයේ නියැළුන ද සිය නිෂ්පාදන අතිරික්තය හම්බන්තොට ජාත්‍යන්තර වරාය හරහා අපනයනය කිරීමට ද සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් ආයතනය බලාපොරොත්තු වේ.

# SLIIT සිසුන්ගේ දායකත්වයෙන් NBQSA 2021 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී සම්මාන රැසක් දිනා ගනී

SLIIT පරිගණක පීඨයේ සිසුන් NBQSA 2021 ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙලේදී සම්මාන කිහිපයක් දිනා ගනිමින් ඔවුන්ගේ සුවිශේෂී වූ කුසලතාවයන් එළිදක්වන ලදී.

ශ්‍රී ලාංකේය තොරතුරු තාක්ෂණයේ (IT)උන්නතිය වෙනුවෙන් NBQSA සම්මාන උළෙල, පසුගිය දශක දෙකක කාලය තුළදී BCS වරලත් ආයතනය විසින් සංවිධානය කර ඇත. දේශීය මෘදුකාංග කර්මාන්තය සඳහා රටේ දීර්ඝතම ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සම්මාන උළෙල ලෙස පිළිගැනෙන මෙම සම්මාන ප්‍රධානොත්සවය මඟින් ජාතියේ ප්‍රයෝජනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ මුල පිරීම්, නවෝත්පාදන සහ සේවාවන් සඳහා දායක වූ පුද්ගලයින්, සිසුන්, ව්‍යවසායකයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සංවිධානවල විශිෂ්ඨ වූ ජයග්‍රහණයන් ඇගයීමට ලක් කරනු ලබයි.

SLIIT පරිගණක පීඨයේ අවසන් වසරේ උපාධි පර්යේෂණ ව්‍යාපෘති තෝරාගෙන NBQSA ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන සඳහා ඉදිරිපත් කරනු ලැබේ. 2021 වසරේදී සිසුන් ව්‍යාපෘති 260 කට අධික ප්‍රමාණයක් සම්පූර්ණ කරනු ලැබූ අතර ඉන් හොඳම ව්‍යාපෘති 21ක් තරගය සඳහා තෝරා ගන්නා ලදී.

වසර ගණනාවක් පුරා SLIIT හි සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති ඉහළම මට්ටමේ අධ්‍යයන ගුණාත්මක භාවයක් පවත්වා ගනිමින් කර්මාන්ත සහ සමාජයීය අවශ්‍යතා සපුරාලීමට ඇති හැකියාව පිළිබඳව ඇගයීමට ලක්ව ඇත.

SLIIT වෙත කීර්තියක් ගෙන දෙමින් ජාතික ආපදා (ශිෂ්‍ය කාණ්ඩය) සඳහා හොඳම විසඳුම ලෙස Coco-Remady ව්‍යාපෘතිය සම්මානයට පාත්‍ර විය. ආචාර්ය ජානක විජේකෝන් විසින් ව්‍යාපෘතිය අධීක්ෂණය කරනු ලැබූ අතර, එහි සම අධීක්ෂණය ඩිලානි ලුණුගලගේ මෙනවිය විසින්ද, බාහිර අධීකෂණය ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනයේ ආචාර්ය නයනි අරච්චිගේ විසින්ද සිදු කරන ලදී.

# ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙතින් "ජන රැකුම" පුද්ගල හදිසි අනතුරු ආවරණය



ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් පොදු ජනතාව සඳහා රක්ෂණයේ ප්‍රතිලාභ පුළුල් කරමින් ඔවුන්ට රැකවරණය සැලසීම සඳහා "ජන රැකුම" පුද්ගල හදිසි අනතුරු ආවරණය හඳුන්වා දී තිබේ.

මෙම ජන රැකුම පුද්ගල හදිසි අනතුරු ආවරණය ඔස්සේ එදිනෙදා ජීවිතයේ සිදුවන හදිසි අනතුරු අවදානම් අවම කිරීම සඳහා ආවරණය ලබාදෙයි. වසරකට රු. 700/- , රු.1250/- සහ රු. 2100/- වැනි ඉතා පහසු වාරික යටතේ මුළු රක්ෂිත අගය රු. 250,000, රු.500,000/- සහ රු.1,000,000/- ලෙස හදිසි අනතුරු හේතුවෙන් සිදුවන මරණ සඳහා ප්‍රතිලාභ ලබාදෙයි. එසේම මෙම ආවරණය යටතේ අවමංගල්‍යාධාර ප්‍රතිලාභය සහ හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන රෝහල් ගතවීමකදී දෛනික රෝහල් ගාස්තු ප්‍රතිලාභයද ලබාගත හැකිය. එමෙන්ම මෙම සමග අමතර ආවරණ ලෙස යතුරුපැදි ආවරණය සහ දවසේ පැය 24 සඳහාම ලොව පුරා ආවරණය ලබාගත හැකිය.

දැරිය හැකි වාරිකයක් යටතේ ලබාගත හැකි මෙම රක්ෂණ ආවරණය ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් වෙතින් හඳුන්වාදෙන ලද "සැමට රැකවරණය " යන සංකල්පය ඔස්සේ විවිධ ජන කොටස් සඳහා ආවරණය සැලසීම සඳහා වඩා ප්‍රායෝගික සහ පහසු රක්ෂණ විසඳුම් හඳුන්වාදීමේ ක්‍රියාවලියෙහි එක පියවරක් ලෙස හැඳින්විය හැකිය.

තවදුරටත් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් මෙම නව රක්ෂණ සැලසුම් හඳුන්වාදීම මගින් සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත සුරක්ෂිත කරමින් සහ ජීවන තත්වය ඉහල නංවමින් ආර්ථික ස්ථාවරත්වය නංවාලීම සඳහා කටයුතු කරයි.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා සහ ප්‍රධාන විධායක නිලධාරී චන්දන එල්. අලුත්ගම මහතා සහ ආයතනික කළමනාකාරිත්වය " ජන රැකුම" පුද්ගල හදිසි අනතුරු ආවරණය හඳුන්වාදීම සංකේතවත් කිරීම සඳහා "ජන රැකුම" පුද්ගල අනතුරු ආවරණය ලබාගත් අතර , ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට රක්ෂණාවරණය මිලදී ගැනීමට අවස්ථාව සලසමින් ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් හි සියලුම දෙපාර්තමේන්තු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් සභාපති ඉංජිනේරු විජිත හේරත් මහතා ජන රැකුම" පුද්ගල හදිසි අනතුරු ආවරණය ලබාගත් අයුරු ඡායාරූපයෙන් දැක්වේ





# SLT-MOBITEL ජාතික රුක්රෝපණ දෙවැනි අදියර උමංදාවේදී

ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විසඳුම් සම්පාදක වන SLT-MOBITEL" 'රට පුරා හුස්මයි පොහොරයි වගා කරමු' නමින් ආරම්භ කළ ජාතික රුක්රෝපණ වැඩසටහනේ දෙවැනි අදියර මැල්සිරිපුර, මඩහපොල උමංදාව බෞද්ධ විශ්ව ගම්මානයේදී පසුගියදා දියත් කෙරුණි. තිරසාර අනාගතයක් උදෙසා වාතයේ තත්ත්වය වැඩිදියුණු කිරීම සහ දේශගුණ විපර්යාසවල බලපෑම අවම කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණු වේ.

SLT-MOBITEL නියෝජනය කරමින් SLT හි සාමාන්‍යාධිකාරී (උතුරු මැද සහ වයඹ පළාත) සමන්ත ජයසිංහ, සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ සේවා) අනුරුද්ධ සූරියාරච්චි, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වයඹ (නැගෙනහිර පළාත) බන්දුල විතාරම, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි ක්‍රියාකාරකම්) ඇන් ප්‍රනාන්දු, මොබිටෙල්හි කලාප කළමනාකරු රන්මල් ෆොන්සේකා, දිස්ත්‍රික් කළමනාකරු නිරෝෂා කරුණාරත්න යන මහත්ම මහත්මීන් ඇතුළු SLT-MOBITEL ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය එම අවස්ථාවට එක්ව සිටියේය.

# දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ කාගිල්ස් සමාගම පෙරමුණට



දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට (SME) සහාය දැක්වීමේ සිය දීර්ඝ කාලීන වැඩ පිළිවෙල අඛණ්ඩව කරගෙන යන ක්රටසකකි සමාගම, SME පුහුණු වැඩමුළු මාලාවක් පැවැත්වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ එක්ව කටයුතු කරයි. පළමු වැඩමුළුව මාර්තු මස 03 වැනි දින රාජගිරියේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු විදු පියසී ශ්‍රවණාගාරයේදී පවත්වන ලද අතර එහි සමාරම්භක සැසිය ශ්‍රී ලංකා මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට කෘෂිකර්ම අමාත්‍යාංශය, රාජ්‍ය ආයතන, විදේශ තානාපති කාර්යාල, ජාත්‍යන්තර සංවිධාන සහ විද්වතුන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසක් සහභාගී විය. මෙම පුහුණු වැඩමුළුවට කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100කට අධික පිරිසක් සහභාගී විය.

මෙම පුහුණු වැඩමුළුව **Cargills zVillage to Home'** වැඩසටහනේ තවත් එක් දිගුවක් වන අතර එමඟින් **Cargills FoodCity** පරිශ්‍ර වල කුටි ලබාදෙමින් රටේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට විශාල පාරිභෝගික ජාලයක් සමඟ සම්බන්ධ වීමට වේදිකාවක් සලසා දෙයි. අද වන විට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100 කට අධික සංඛ්‍යාවක් මෙම කාගිලස් මෙන් ගෙදරටී වැඩසටහනට සහභාගී වී ඇත.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තම නිෂ්පාදන වෙළෙඳපොළට ගෙන ඒමේදී මුහුණ දෙන අභියෝග, එනම් මූල්‍ය සාක්ෂරතාව අඩුකම සහ වෙළෙඳපොළ ප්‍රමිතීන් සහ තාක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැනි අභියෝග හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය සාක්ෂරතා පුහුණු වැඩසටහන සමඟ එක්ව කුඩා ව්‍යාපාර හිමියන් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීමට **Cargills** සමාගම කටයුතු කරයි. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මේවාට සහභාගී වීමෙන් මූලික මූල්‍ය සාක්ෂරතාව, ඇසුරුම්කරණය සහ නිෂ්පාදන සංවර්ධනය සහ තත්ත්ව සහතිකය පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබෙනු ඇත. මෙම කුඩා ව්‍යාපාර හිමියන් දේශීය ආර්ථිකයට අර්ථවත් ලෙස දායක විය හැකි සාර්ථක ව්‍යවසායකයින් බවට පත් කිරීමට කාගිල්ස් සමාගම කැපවී සිටියි.

# මහින්ද්‍ර අයිඩියල් ලංකා සමාගම මෙරටදී එකලස් කළ නවතම Bolero City Pik-Up රථය වෙළෙඳපොළට හඳුන්වා දෙයි

**ශ්‍රී ලංකාවේ පළමු වරට නිෂ්පාදනය කළ වාණිජ රථය ලෙස Mahindra Bolero City Pik-up රථය වෙළඳපොළට හඳුන්වා දී ඇති අතර මෙය ලංකාවේ දැනට භාවිත 1.4 T එකම සැහැල්ලු ට්‍රක් රථයද වේ**

Mahindra & Mahindra Ltd. (M&M Ltd.) සහ අයිඩියල් මෝටර්ස් අනුබද්ධිත අයිඩියල් සමූහ ව්‍යාපාරය විසින් නිෂ්පාදනය කළ නවතම Bolero City Pik-Up රථය මෙරට වෙළඳපොළට හඳුන්වා දීම බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටලයේදී පසුගියදා සිදුවිය.

මේ අනුව, Bolero City Pik-Up රථය මෙරටදීම එකලස් කොට නිෂ්පාදනය කළ ප්‍රථම වාණිජ රථය බවට පත්වනු ඇත. මෙහි සියලු නිෂ්පාදන කටයුතු සිදු කෙරුණේ 2019 වසරේ විවෘත කළ වැලිපැන්න ප්‍රදේශයේ පිහිටි Mahindra Ideal Lanka Automotive Assembly Plant නම් වූ මෝටර් රථ එකලස් කිරීමේ අංගනයේදීය. මෙම රථය වෙළඳපොළට හඳුන්වා දීම වෙනුවෙන් කොළඹ පැවති උත්සවයේදී මෙහි පළමු රථ 5 පාරිභෝගිකයන් වෙත ලබා දීම සිදු විය.

Mahindra ideal lanka යනු ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ වාණිජ රථවාහන නිෂ්පාදනයේ ප්‍රමුඛතම සමාගමක් වන අතර මෙම හඳුන්වා දීමත් සමඟ එම ස්ථාවරය තව දුරටත් තහවුරු කරන්නට සමාගමට හැකියාව ලැබී ඇත. වසංගත තත්ත්වය හමුවේ වුවද ක්‍රමානුකූලව වෙළඳපොළ යළි විවෘත වෙමින් පවතින වාතාවරණයක් තුළ මෙරට වාණිජ වාහන සඳහා ඇති ඉල්ලුමද සැලකිය යුතු අයුරින් ඉහළ යමින් තිබෙන බව පෙනෙන්නට ඇති සත්‍යයකි. විශේෂයෙන්ම සැහැල්ලු ට්‍රක් රථ වර්ගයේ වාහන සඳහා ඇති ඉල්ලුම සපුරාලනු වස් මෙරට වාහන නිෂ්පාදන ක්‍රියාවලිය වේගවත් කරන්නට සමාගම නිරන්තරයෙන් කටයුතු කරයි.



මහින්ද්‍ර අයිඩියල් ලංකා සමාගම විසින් මෙරටදී එකලස් කරන ලද Mahindra Bolero city pick-up රථය ඉන්දියාවේ මහින්ද්‍ර ඇන්ඩ් මහින්ද්‍ර සමාගමේ රථවාහන අංශයේ ප්‍රධාන විධායක නිලධාරි විජේ නක්‍රා, අයිඩියල් ව්‍යාපාර සමූහයේ නිර්මාතෘ හා සභාපති නලීන් වෙල්ගම යන මහත්වරුන් විසින් හඳුන්වාදුන් අයුරු ඡායාරූපයේ දැක්වේ.
ඡායාරූපය සමන් රණවීර

# SAMSUNG සිය නවතම ගැලැක්සි Devices නිර්මාණය කිරීම සඳහා ඉවතලන මාළු දැල් යොදා ගනී

**සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස්, සාගර ආශ්‍රිත ප්ලාස්ටික් සඳහා නව ජීවයක් එක් කරමින් සිය එකිනෙකට වෙනස් වූ Galaxy devices නිෂ්පාදනය සඳහා නව අමුද්‍රව්‍යයක් නිපදවීමට පියවර ගෙන ඇත.**

ඒ තිරසාරබව හා නවෝත්පාදනය එක් කළ ආයතනික පියවරක් ලෙසිනි. සාගර ආශ්‍රිතව ඇති ඉවත දැමූ ධීවර මාළු දැල් නැවත වෙනත් අරමුණක් සඳහා භාවිත කිරීමේ අරමුණින් (repurposed) මෙම නව අමුද්‍රව්‍ය නිපදවනු ලබයි. විශේෂයෙන් පරිසරය උදෙසා වූ **Galaxy for the Planet** යන අපගේ ගමන් මගේ තවත් පියවරක් වන මෙම අමුද්‍රව්‍ය භාවිතය තුළින් පාරිසරික හානිය අවම කිරීමටත් **Galaxy** පාරිභෝගිකයන් වෙත තිරසාර ජීවන රටාවක් උරුම කර දීමටත් සැම්සුන් ඉලෙක්ට්‍රොනික්ස් අරමුණු කරයි.

සාගර ආශ්‍රිත ප්ලාස්ටික් භාවිත කර නිපදවන ලද අමුද්‍රව්‍ය ඉදිරියේදී සැම්සුන්හි සමස්ත නිෂ්පාදන මාලාවට ඇතුලත් කරනු ඇති අතර පසුගියදා පැවති Unpacked හිදී එළිදක්වනු ලැබූ සැම්සුන් හි නවතම **Galaxy devices** සමඟින් එම වැඩපිළිවෙල පිළිබඳව වැඩිදුර තොරතුරු අනාවරණය විය. එක් වරක් භාවිත කරන ලද ප්ලාස්ටික් පරිසරයෙන් ඉවත් කිරීමට මෙන්ම පාරිභෝගිකයින් භාවිත කර ඉවත දැමූ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීයකරණය කර නිපදවන ලද ද්‍රව්‍ය (post-consumer material-PCM) හා ප්‍රතිචක්‍රීයකරණය කළ කඩදාසි වැනි වෙනත් පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතය තවදුරටත් ඉහළ නැංවීම සඳහා වන සැම්සුන් හි දැනට සිදු කරගෙන යනු ලබන ප්‍රයත්නය මෙම **devices** තුළින් මනාව ප්‍රදර්ශනය කරනු ඇත. මෙම සුවිශේෂී පරිවර්තනයත් සමඟ අනාගතයේදී Galaxy තාක්ෂණය සමඟින් ප්‍රමුඛ නිර්මාණයන් පාරිභෝගිකයා වෙත ගෙන එනු ඇති අතරම වඩා යහපත් පාරිසරික බලපෑමක්ද එල්ල කරනු ඇත.

# Sageis Campus උපාධිධාරීන්ට වැඩි රැකියා අවස්ථා පිරිනැමීමට Virtusa සමග අවබෝධතා ගිවිසුමකට




කොළඹ පිහිටි මෙරට ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයක් වන Sageis Campus සිට උපාධිධාරීන්ට ඉහළ මට්ටමේ රැකියා අවස්ථා පිරිනැමීම අරමුණු කර ගනිමින්, මෙරට ඩිජිටල් නවෝත්පාදන ඉංජිනේරු අංශයේ ප්‍රමුඛයකු වන Virtusa පුද්ගලික සමාගම සමග පසුගියදා විශේෂ අවබෝධතා ගිවිසුමකට අත්සන් තැබීය.

Virtusa ආයතනය සමග ඇතිකරගත් සහයෝගීතාව මගින් Sageis Campus උපාධිධාරීන්ට හිමිවන ප්‍රයෝජන රැසකි. තාක්‍ෂණය මත පදනම්වූ වර්තමාන ලෝකයේ ඉහළ ඉල්ලුමක් ඇති රැකියා අවස්ථාවක් ලබාගැනීමට ඔවුන්ට අවස්ථාව උදාවීම ඒ අතුරින් විශේෂිත වේ. ඊට අමතරව දැනුම සහ කුසලතා අතර පවතින පරතරය අවම කර ගැනීමේ අවකාශයද ඔවුන්ට හිමි වේ. තවද ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය තොරතුරු තාක්‍ෂණ කර්මාන්තයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම කරා යන ගමන සඳහා දායකවීමටද හැකියාව ලැබේ.

Sageis Campus උප කුලපති මහාචාර්ය නාලක ජයකොඩි සහ Virtusa ජ්‍යෙෂ්ඨ අධ්‍යක්‍ෂ සම්පත් ත්‍රීමාවිතාන යන මහත්වරු අවබෝධතා ගිවිසුම හුවමාරු කරගන්නා අයුරු

උපාලි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් 2022 මාර්තුමස 13 වැනිදා ඉරිදා හෝමාගම පිහිටි උපාලි යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.